# පුස්කොළ ලේඛන කලාව සඳහා භාවිත කර ඇති අක්ෂර ශෛලීන්

**මේනකා නිශාන්ති**
ප්‍රධාන පුස්තකාලය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
nishanthi@sjp.ac.lk

ලෝකයේ ජීවත් වූ සෑම ජන කොටසක්ම තමන්ගේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා විවිධ වූ සන්නිවේදන ක්‍රම භාවිතා කරන ලදී. එම සන්නිවේදන ක්‍රම නම්, කථනය හා ලේඛනයයි. ලේඛනයේ ආරම්භය සඳහා ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇති අතර ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් සලකුණු මාර්ග යෙන් අදහස් හුවමාරු කර ගැනීමට උත්සාහගත් බව ගුහා ආශ්‍රිතව ඇති රූප සටහන් වලින් පැහැදිලි වේ. මීට අමතරව පුරා විද්‍යාත්මක මූලාශ්‍ර මඟින් අතීතයේ දී ලංකාවේ චිත්‍රාක්ෂර භාවිතා කළ බවට සාධක දක්නට ඇත. චිත්‍රාක්ෂර සහිත කාල රක්ත වර්ණ හා රක්ත වර්ණ මැටි මෙවලම් අනුරාධපුර ගෙඩිගේ, ආනයිකොට්ටෙයි, ඉබ්බන්කටුව, කන්තරෝදෙයි, කොල්ලන් කනත්ත, පොම්පරිප්පු වැනි ස්ථාන වලින් හමුවීම තුළින් චිත්‍රාක්ෂර කලාවක් ද මෙරට තිබූ බව පැහැදිලි වේ.

මහින්දාගමනයෙන් පසුව මෙරට ලේඛන කලාව පුළුල් ලෙස ව්‍යාප්ත වූ බව පිළිගත් මතය වුවත් ඊට පෙර සිටම මෙරට ලේඛන කලාවක් පැවති බව වංශ කථා තුළින් හෙළිවේ. ක්‍රි. පූ. 06 වන සියවසයේ විජය කුමරු ඇතුලු පිරිස ජනාවාස පිහිටුවාගත් පසු ඔහුගේ අභිෂේකය සඳහා පඬි රජුගෙන් දියණියක් කැඳවාගෙන එන ලෙස දන්වා පඬුරු සහ ලේඛනයක් සමඟ දූතයන් යැවූ බව මහාවංශයේ සඳහන් වේ. ක්‍රි. පූ. 04 වන සියවසයේ පණ්ඩුකාභය කුමාරයා පණ්ඩුල නම් බ්‍රාහ්මණයාගෙන් ශිල්ප ශාස්ත්‍රය හැදෑරූ බවත්, පණ්ඩුල නම් බ්‍රාහ්මණයා විවිධ ශිල්ප හා භාෂා ශාස්ත්‍රයන් ප්‍රගුණ කළ බ්‍රාහ්මණයකු බවත් මහාවංශයේ සඳහන් වේ. ඒ අනුව පණ්ඩුකාභය කුමාරයා අක්ෂර හා ලේඛන කලාව ද ප්‍රගුණ කරන්නට ඇති බව පැහැදිලිය. මෙයට අනුව පැහැදිලි වනුයේ ක්‍රි. පූ. 03 වන සියවසට පෙර සිටම මෙරට ලේඛන කලාව පැවති බවය. කෙසේ වෙතත් ලේඛන කලාව තුළ සුවිශේෂී වූ ස්ථානයක් සනිටුහන් වන්නේ වළගම්බා රජු දවස මුඛ පරම්පරාවෙන් සුරක්ෂිතව පවත්වාගෙන ආ ත්‍රිපිටකය මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟ ය. එය මෙරට ලේඛන කලාවට එක් කලේ නව මුහුණුවරකි. එසේ රාජ්‍ය අනුග්‍රහය ලබමින් පුස්කොළ ලේඛන කලාව විකාශනය වූයේ ද විහාරාරාම ආශ්‍රිතව ය. මෙම විහාර ආරාම වල තිබූ පොත්ගුල පෝෂණය වූයේ ද පුස්කොළ පොත් ආශ්‍රයෙනි.

පුස්කොළ පොත් ලේඛන කලාවේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්විය හැකි ය. මේ යුගයේ දී නව ග්‍රන්ථ සමූහයක් රචනා කර ඇති අතර පැරණි පොත් පත් විශාල සංඛ්‍යාවක් පිටපත් කර තිබේ. ඒ අතර ආගමික කෘති, භාෂා සාහිත්‍ය, වෛද්‍ය ශාස්ත්‍රය, පශු චිකිත්සාව, ජෝතිෂය ශාස්ත්‍රය, යන්ත්‍ර මන්ත්‍ර, ප්‍රබන්ධ, සිරිත් විරිත් හා උත්සව, නීතිය, කඩයිම් පොත්, විත්ති පොත්, ඉතිහාසය, බදු හා ආදායම්, කෘෂිකර්මය, රාජ්‍ය පාලනය, බෞද්ධ අධ්‍යාපනය, ලෝක විස්තර, සංගීතය හා කලා ශිල්ප ආදී විවිධ විෂයන්ට අයත් පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් රචනා කර ඇත. අතීතයේ පුස්කොළ පොත් රචනා කළ කතුවරුන්

අක්ෂර මෙන්ම ඉස්පිලි පාපිලි ද සමාන බවින් යුක්තව රචනා කර ඇත. ඊට අමතරව පුස්කොළයේ ඇති ඉඩ ප්‍රමාණය සැලකිල්ලට ගෙන ලිවිය හැකි පේළි ගණන හා අක්ෂර වල විශාලත්වය පිළිබඳව ද තීරණය කර ඇත. වමේ සිට දකුණට එකම ශෛලියට ලිවීමත්, ඒ ඒ අක්ෂරයන්ට අයත් සියළුම අංග ඊට එකතු කිරීමටත්, සෑම අකුරක්ම සමමිතිකව ලිවීමටත් පුස්කොළ පොත් රචනා කළ කතුවරුන් ප්‍රවේශම් වී ඇත. තවද පුස්කොළ පොත් රචනා කිරීමේ දී ඒ ඒ අකුරු පේළි අතර තිබිය යුතු ඉඩ ප්‍රමාණය පිළිබඳවත් සැලකිළිමත් වී ඇත. මෙසේ රචනා කළ පුස්කොළ ලේඛන ප්‍රධාන වශයෙන් "මහා සම්ප්‍රදාය" සහ "චූල සම්ප්‍රදාය" යනුවෙන් ප්‍රධාන වශයෙන් ද්විධාකරණය කොට දැක්විය හැකිය. මහා සම්ප්‍රදායට අයත් පුස්කොළ පොත් වන්නේ ත්‍රිපිටකාගත සාහිත්‍යය ද ඇතුළු සම්භාව්‍ය සිංහල, පාළි හා සංස්කෘත ග්‍රන්ථයන්ය. ව්‍යක්ත ස්වරූපයක් නොගන්නා කෘති මෙන්ම තදනන්තර කලාවිධීන්හි දී විද්වතුන් නොවන සාමාන්‍ය ජනී ජනයා විසින් රචිත විවිධ ග්‍රන්ථ චූල සම්ප්‍රදායට අයත් සේ සැලකිය හැකිය. විශේෂයෙන් දෛවඥයන්, දේශීය වෛද්‍ය-වරුන්, මන්ත්‍රාචාරීන් හා විවිධාකාර ශිල්පීන් රචනා කරන ලද 'වට්ටෝරු පොත්', 'මන්ත්‍ර පොත්' බඳු සාමූහික ග්‍රන්ථ නාමාවලීන් හඳුන්වනු ලබන, නිශ්චිත ග්‍රන්ථ නාම විරහිත, පත් ඉරු සංඛ්‍යාවෙන් අඩු පුස්කොළ පොත් මේ ඝණයට ඇතුලත්ය. මෙම පුස්කොළ පොත් රචනා කිරීම සඳහා අක්ෂර වර්ග කිහිපයක් භාවිතා කර ඇත. එනම් සිංහ ශෛලිය, හස්ථි ශෛලිය, හංස ශෛලිය හා කාක ශෛලියයි. ඒ ඒ පළාත් වලට අනුව "අක්ෂර" වර්ග කර දක්වා ඇත. එනම් රුහුණු, මායා, පිහිටි යන පළාත් තුන මුල්කර ගෙනය. රුහුණු රටේ භාවිතා කල අක්ෂර මුලකුරු වන අතර මායා රටේ හි අක්ෂර රළු විය. එහෙයින් ඒවා සිහකුරු නමින් හැඳින්වේ. පිහිටි රට අක්ෂර අණ්ඩාකාර ස්වරූපයක් ගන්නා හෙයින් එම ප්‍රදේශයට ආවේණික අක්ෂර ගජකුරු ලෙස හැඳින්විය.

පුස්කොළ පොත් රචනා කළ කතුවරුන් නිරන්තරයෙන් අක්ෂර පිළිබඳ සැලකිලිමත් විය. ඒ අනුව ඉස්පිළි හා පාපිළි අනුවම අක්ෂර පිටපත් කිරීමට වග බලා ගෙන ඇත. බොහෝ විට සම්භාව්‍ය මට්ටමේ ග්‍රන්ථ රචනා කිරීමේ දී සුන්දර අංග සම්පූර්ණ අක්ෂර මත පිහිටා පුස්කොළ පොත් රචනා කර ඇත. භාෂාව හරිහැටි නොදත් පිටපත් කරුවන් පුස්කොළ පොත් රචනා කිරීමේ දී මෙම අක්ෂර වලින් පරිබාහිර අක්ෂර ශෛලීන්ට ද යොමු වී ඇත. බොහෝ විට මෙලෙස රචනා කර ඇත්තේ වෙද පොත්, ශාන්ති කර්ම හා ජෝතිෂය පිළිබඳව තොරතුරු ඇතුළත් පුස්කොළ පොත්ය. මෙසේ විවිධ අක්ෂර ශෛලීන් භාවිතා කර අතීතයේ දී විවිධ විෂය පථයන් ආවරණය වන පරිදි පුස්කොළ පොත් රචනා කර ඇති බව පැහැදිලිය.

